**සුරාබදු ආඥාපනත**

**අංක 10/2018 දරන සුරාබදු නිවේදනය**

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතු සඳහා වූ රීති සංශෝධනය**

සංශෝධනය කරන පරිදි (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 2,12, 22 සහ 25 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා සුරාබද්ද නමින් 2018 පෙබරවාරි මස 21 වන දින අංක 2059/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 07/2018 දරන සුරාබදු නිවේදනය යාවත්කාලීන කිරීම සහ පහසු කිරීමේ අරමුණින් පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජුනි මස 13 දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**රීති**

1. 3 වන ඡේදයේ V උප වගන්තියේ "පානීය නොවන ස්ප්‍රීතු" යන වචනය ඉවත් කර "මෙතන්. 1. ඕල් ($CH_3$ - OH) ස්ප්‍රීතු" යන වචනය ආදේශ කිරීමෙන් හා "අනුමත ආයතනයෙන්" යන වචන ඉවත් කර "අනුමත ආයතනයන්" යන වචන ආදේශ කිරීමෙන්,

2. 3 වන ඡේදයේ V උප වගන්තියේ පළමු ඡේදය අවසන් වූ වහාම පහත සඳහන් ඡේදය ඇතුලත් කිරීමෙන්,

   "මෙම නිවේදනයේ I වන උපලේඛනයේ සඳහන් අනෙකුත් පානීය නොවන ස්ප්‍රීතු සඳහා අනුමත විපරීතකාරක එකතු කල යුතු බවට නියම කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත"

3. 5 වන ඡේදය අවසන් වූ වහාම පහත සඳහන් ඡේදය 6 වන ඡේදය ලෙස ඇතුලත් කිරීමෙන්,

   " 6. සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී, සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශ මත බලපත්‍ර කාලසීමාවට අදාලව බලපත්‍රධාරී ලබා ගැනීමට අපේක්ෂිත පානීය නොවන ස්ප්‍රීතු ප්‍රමාණය සඳහා අනුමත ලිපියක් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල යුතුය."

4. II වන උපලේඛනයේ I ආකෘතියේ 7 හි iii වන කරුණ ලෙස පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන්,

   " iii. වාර්ෂිකව ආනයනය කිරීමට අපේක්ෂිත පානීය නොවන ස්ප්‍රීතු ප්‍රමාණය (වර්ග අනුව වෙන් වෙන් වශයෙන්)"

5. II වන උපලේඛනයේ II වන ආකෘතියේ 6 ii හි "(නාමමාත්‍ර ඉන්වොයිසිය ඇමිණිය යුතුය)" යන වචන අවසන් වූ වහාම "(එසේ වුවද ප්‍රායෝගික ගැටළු මතු වන අවස්ථාවක දී නාමමාත්‍ර ඉන්වොයිසිය කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි ඉවත් කල හැක.)" යන වචන ආදේශ කිරීමෙන්,

6. II වන උපලේඛනයේ II ආකෘතියේ අංක 7 වගන්තිය ඉවත් කර පහත සඳහන් නව වගන්තිය ආදේශ කිරීමෙන් "7. සෑම ඉල්ලුම් පත්‍රයක්ම අදාල සුරාබදු ස්ථානාධිපතිගේ නිර්දේශ සහිතව සෘජුවම සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය."

7. III වන උපලේඛනයේ I වන තීරයේ 1 හා 2 හි "අලෙවිය" යන වචනය ඉවත් කර "විකිණීම" යන වචනය ආදේශ කිරීමෙන්,

8. iv වන උපලේඛනයේ I ආකෘතියේ 7 වන කෝන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් කොන්දේසිය ආදේශ කිරීමෙන් "තත්කාලීන සුරාබදු නිවේදන කොන්දේසි හා බලපත්‍ර කොන්දේසි කඩ කලහොත් සුරාබදු ආඥාපනතේ (52 අධිකාරිය වූ) 56 හෝ 48 යටතේ ක්‍රියා කරනු ලබයි."

9. iv වන උපලේඛනයේ II ආකෘතියෙහි මාතෘකාවෙහි "බලය ලත් වෙළඳුන් සඳහා" යන වචන ඉවත් කිරීමෙන්,

10. iv වන උපලේඛනයේ II ආකෘතියෙහි 7 වන කොන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් නව කොන්දේසිය එකතු කිරීමෙන් "තත්කාලීන සුරාබදු නිවේදන කොන්දේසි හා බලපත්‍ර කොන්දේසි කඩ කළහොත් සුරාබදු ආඥාපනතේ (52 අධිකාරිය වූ) 56 හෝ 48 යටතේ ක්‍රියා කරනු ලබයි."

11. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි මාතෘකාව ඉවත් කර පහත සඳහන් නව මාතෘකාව ආදේශ කිරීමෙන් "පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීම හා විකිණීම සඳහා වූ බලපත්‍රය (18 වන වගන්තිය)"

12. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි වගුවේ අංක 1 හි දැක්වෙන පහත සඳහන් වචන "(තොග/සිල්ලර)", "විවෘත හා අවසන් කරන වෙලාවන්." ඉවත් කිරීමෙන් සහ '(ගබඩා කිරීමේ / සිල්ලරට විකිණීමේ)'යන්න ආදේශ කිරීමෙන්,

13. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි වගුවෙහි අංක 6 (i) හි සඳහන් "පානීය නොවන ස්ප්‍රීතු තොග"යන්න වෙනුවට "පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීමේ" යන වචන ආදේශ කිරීමෙන්,

14. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි වගුවෙහි අංක 6 "බලපත්‍ර දීමේ අධිකාරිය" යන වචන වෙනුවට "සුරාබදු කොමසාරිස් ජනරාල්" යන වචන ආදේශ කිරීමෙන්,

15. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක I හි "තොග / සිල්ලරට විකිණීම සඳහා" යන වචන වෙනුවට "ගබඩා කිරීම සහ සිල්ලරට විකිණීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන්,

16. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 3 හි "පානීය නොවන ස්ප්‍රීතු සෑම තොග" යන්න වෙනුවට "පානීය නොවන ස්ප්‍රීතු සෑම ගබඩා කරන්නෙකුම" යන වචන ආදේශ කිරීමෙන්,

17. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 5 හි "කිලෝ ග්‍රෑම් 4.5" යන වචන වෙනුවට "කිලෝ ග්‍රෑම් 7.5 " යන්න ආදේශ කිරීමෙන්,

18. iv වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 6 හි "කිලෝ ග්‍රෑම් 600" යන වචන වෙනුවට "කිලෝ ග්‍රෑම් 1000 " ලෙස ආදේශ කිරීමෙන්,

19. iv වන උපලේඛනයේ IV ආකෘතියෙහි වගුවේ අංක 1 "බලපත්‍රයේ" යන වචනය ඉවත් කිරීමෙන්,

20. vi වන උපලේඛනයේ II වන ආකෘතියෙහි 'කොළඹ' යන වචනය ඉවත් කර 'රාජගිරිය' ලෙස ආදේශ කිරීමෙන් සහ "බලයලත් රේගු නිළධාරී" යන වචන අවසන් වූ වහාම "/බලයලත් ආයෝජන මණ්ඩල නිලධාරී" ලෙස ඇතුලත් කරමින් සංශෝධනය කිරීමෙන්,